# හඳුනාගැනීමෙන් ගැනීමෙන් පසු මිනුම්කරණ

වයාපාරයක් විසින් මුල්වරට දේපලපිරියත උපකරණ පිරිවැයට හඳුනා හඳුනාගැනීමෙන් පසු මිනුම් කිරීමට පහත ආකෘති දෙකෙන් එකක් තෝරා ගත් යුතුය

- පිරිවැය ආකෘතිය
- ප්‍රත්‍යාගණන ආකෘතිය

## ප්‍රත්‍යාගණන ආකෘතිය

සමුච්චිත ක්ෂය වත්කමේ පිරිවැයට එරෙහිව අහෝසිකර වත්කමේ ධාරණ අගය ප්‍රත්‍යාගණන අගය ලෙස සැලකීමේ ක්‍රමය **පත්‍යාගණන ආකෘතිය** යන්නෙන් අදහස් වේ·

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් පන්තිය ප්‍රත්‍යාගණනය කළ යුතුය· එනම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණන කරන්නේ නම් ව්‍යාපාරයට අයත් සියලුම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ යුතුය·

## පළමුවර ප්‍රත්‍යාගණනයට අදාළ ද්විත්ව සටහන්

**ප්‍රත්‍යාගණනය කරන දින දක්වා සමුච්චිත ක්ෂය**

| | |
|---|---|
| අදාල සමුච්චිත ක්ෂය ගිණුම හර | |
| අදාල වත්කම් ගිණුම | බැර |

**ප්‍රත්‍යාගණන ලාභය**

| | |
|---|---|
| අදාල වත්කම් ලිණුම හර | |
| ප්‍රත්‍යාගණනන සංචිත ගිණුම බැර ( වෙනත් විස්තීරණ ආදායම් වලට එකතු කළ යුතුය) | |

**ප්‍රත්‍යාගණන අලාභය කදී**

| | |
|---|---|
| වෙනත් වියදම් ගිණුම් හර/ලාභ ලාභ ගිණුම හර | |
| අදාල වත්කම් ගිණුම | බැර |

මෙලෙස සටහන් කරනුයේ වත්කම් පළමුවරට ප්‍රත්‍යාගණන ගණනයේදී ය

**අභ්‍යාසය** 1

මියුරු සමාගම විසින් රුපියල් 500 000 වටිනා යන්ත්‍රය මිලදී ගත් අතර එය 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ ·වර්ෂ දෙකකට පසු සාධාරණ අගය රුපියල් 600 000 වන අතර එදින සිට යන්ත්‍රය මැනීම ප්‍රත්‍යාගණන ආකෘතියට අනුව සිදු කිරීමට ව්‍යාපාරය තීරණය කරන ලදී ·

යන්ත්‍ර ගිණුම

සමුච්චිත ක්ෂය ගිණුම

**ජ නල් සටහන්**

---

---

------------------------------------------------------------------------------------------------------------------------

---

---

------------------------------------------------------------------------------------------------------------------------

## දෙවන වර ප්‍රත්‍යාගණනය කිරීම

(1) පළමුවරට ප්‍රත්‍යාගණනය කිරීමේදී **ලාභයක්** ලැබී ඇත්නම් දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීමේදී **අලාභයක්** ලැබුණොත්

| |
|---|
| ප්‍රත්‍යාගණන සංචිත හර |
| වෙනත් වියදම් හර (ඉතිරි අලාභය) |
| අදාල වත්කම් ගිණුම් බැර |

(2) පළමු වරට ප්‍රත්‍යාගණන කිරීමේදී **අලාභයක්** ලැබී දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීමේදී **ලාභයක්** ලැබුණොත්

| |
|---|
| අදාළ වත්කම් ගිණුම හර |
| වෙනත් වියදම් ගිණුම බැර |
| ප්‍රත්‍යාගණන සංචිත ගිණුම බැර (ඉතිරි වේ නම්) |

**අභ්‍යාස 2**

ප්‍රවර්තන වර්ෂයේ ලාභය රුපියල් 150 000 පෙර වර්ෂයේ ප්‍රයාගණන අලාභය රුපියල් 100 000 යි· ද්විත්ව සටහන් ලියන්න

------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------

**අභ්‍යාස 3**

නිශ්පාදන ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ ·

| **අයිතමය** | **ගත් දිනය** | **පිරිවැය** | **සුන්බුන් අගය** | **ජීවකාලය** |
|---|---|---|---|---|
| රථ | 2013/1/1 | 1265000 | 65000 | 10 |
| යන්ත්‍ර | 2016/1/1 | 1828000 | 128000 | 5 |

**අතිරේක තොරතුරු**

- ✓ සියලු වත්කම් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි
- ✓ 2019/1/1 දින මෝටර් රථ රු 730 000කට ප්‍රත්‍යාගණනය කර ඇත සුන්බුන් අගය රු 30 000 කි
- ✓ 2019/1/1 දින යන්ත්‍ර රු 800 000 ප්‍රත්‍යාගණනය කර ඇත සුන්බුන් අගයක් නැත

1* රථ හා යන්ත්‍ර ප්‍රත්‍යාගණනය ගැන වාර්තා කිරීමේ ජනල් සටහන්
2* L K A S 1 ට අනුව හෙළිදරව් කිරීමේ ලේඛනය

**අභ්‍යාස 4**

යන්ත්‍ර හා මෝටර් රථ පිළිබඳ තොරතුරු මෙසේය

| අයිතමය | ගත් දිනය | පිරිවැය | සුන්බුන් අගය | ජීවකාලය |
|---|---|---|---|---|
| රථ | 2015/1/1 | 1860 000 | 60 000 | 8 |
| යන්ත්‍ර | 2016/1/1 | 2040 000 | 40 000 | 5 |

**අතිරේක තොරතුරු**

- වත්කම් සරල මාරු ක්‍රමයට ක්ෂය කරයි
- 2019/1/1 දින ගනුදෙනු මෙසේය වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම් මෙසේය
  මෝටර් රථ රුපියල 950 000 සුන්බුන් අගය රු 50 000 යි
  යන්ත්‍ර 640 000 සුන්බුන් අගය රු 40 000 යි
- 2019/07/01 දින 1290 000 කට යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි වර්ෂ හයක් අවසානයේ සුන්බුන් අගය රු 90 000කි

**අවශ්‍ය වන්නේ**

1* ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ ජනල් සටහන්
2* 2019/12/31 දිනට හෙළිදරව් කිරීමේ ලේඛනය

දේපල පිරියත උපකරණ වත්කමක් ලෙස හඳුනා ගැනීමට සපුරාලිය යුතු කොන්දේසි දෙක නම් කරන්න

------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------

**අභ්‍යාස 5**

සීමිත විමුක්ති සමාගමේ 2019/4/1 දිනට යන්ත්‍ර වල වටිනාකම රු1200 000 එදිනට සමුච්චිත ක්ෂය ගිණුමේ ශේෂය රු 400 000

2019/4/1 දින පළමු වරට ප්‍රත්‍යාගණයට අනුව යන්ත්‍ර වල වටිනාකම රුපියල් 950 000

අදාල ජර්නල් සටහන්

------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------------
-

ඉහත යන්ත්‍රය 2019/4/1 දින පළමු වරට රු 750 000ක ට ප්‍රත්‍යාගණනය කළේ නම්

අදාල ජර්නල් සටහන්

-----------------------------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------------
-

මෙම යන්ත්‍රය 20164/1 දින ප්‍රත්‍යාගණනය කරන ලදුව රුපියල් 50,000 අලාභයක් ලැබී ඇත්නම් හා 2019/4/1 නැවත රු 950 000 කට ප්‍රත්‍යාගණනය කළේ නම්

අදාළ ජර්නල් සටහන්

-----------------------------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------------------

මෙම යන්ත්‍රය ් 2019/ 4 /1 දින ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම රු 750 000 හා 2017/4/1 දින ප්‍රත්‍යාගණනය ගණනයේදී රුපියල් 35000 ක අතිරික්තයක් පොත්වල පෙන්වයි නම්

ජර්නල් සටහන් පෙන්වන්න

-----------------------------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------------------------

**අභ්‍යාස 6**

සරංග සමාගම 2019/1/1 දිනට තොරතුරු මෙසේය

| අයිතමය | මිලදී ගත් දිනය | පිරිවැය /ප්‍රත්‍යාගණන | සුන්බුන් අගය | ඵලදායී ජීවකාලය |
|---|---|---|---|---|
| ඉඩම් | 2007/7/1 | 2500 000 | - | - |
| ගොඩනැගිලි | 2009/1/1 | 3260 000 | 260 000 | 50 |
| රථ | 2014/1/1 | 1920 000 | 120 000 | 10 |
| යන්ත්‍ර1 | 2016/7/1 | 1760 000 | 160 000 | 8 |
| යන්ත්‍ර 2 | 2017/7/1 | 1420 000 | 220 000 | 6 |

සියලු වත්කම් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි

2019 වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු හා සිද්ධීන් මෙසේය

1 2019/ 1/1 දින ගොඩනැගිල්ලට නව කොටස්ක් එකතු කර ඇති අතර ඒ සඳහා වූ ප්‍රාග්ධන වැය රු 1360 000 එම කොටසේ සුන්බුන් අගය රු 160 000 මෙහි ජීව කාලය වර්ෂ 60 එමෙන්ම පැරණි ගොඩනැගිල්ලේ නව සුන්බුන් රු 420 000 ක් බව නිගමනය කර ඇත ·

2 2019/ 1/1 දින රථ රු 1220 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත· සුන්බුන් අගය රු 20 000 මෙම රථය 2016/1/1 දින ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එහිදී රුපියල් 20 000 ක ප්‍රත්‍යාගණන අතිරික්තය වාර්තා කර තිබුණි·

3 2019/7/1 දින රු420 000 යන්ත්‍ර 1 නවීකරණය කළ අතර එදින සිට වර්ෂ 10 ක ජීව කාලය ක් අපේක්ෂිතය· සුන්බුන් අගය රු 180 000 යි·

4 2019/ 07/01 දින යන්ත්‍ර 2 ජීව කාලය ඉදිරි වර්ෂ දෙකක් බව නිගමනය විය·

## විභාග අභ්‍යාස

- පහත කුමන ප්‍රකාශ සමාගමක **මුළු විස්තීරණ ආදායම** සම්බන්ධයෙන්යෙන් **නිවැරදි** වේ ද?

A එය කාලච්ඡේද ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම යන දෙකෙහි එකතුවයි·

B එය කාලච්ඡේදය තුළ හා හඳුනාගත් සියලුම ආදායම් සහ වියදම් අත්‍ර වෙන්සයි·

**C** එය කාලච්ඡේදය තුළ හඳුනා හඳුනාගත් සියලුම මෙහෙයුම් ආදායම් සහ මෙහෙයුම් වියදම් අත්‍ර වෙනසයි·

**D** එය කාලච්ඡේදය තුළ අයිතිකරුවන් විසින් අයිතිකරුවන් ලෙස සිදුකරන ගනුදෙනු හා සිද්ධි වලින් හැර අනෙකුත් ගනුදෙනු හා සිද්ධි තුලින් සිදුවන හිමිකමේ වෙනසයි ·

1 A හා B පමණි· 2 A හා C පමණි · 3 B හා D පමණි ·

4 C හා D පමණි· 5 A B හා C **පමණි**·

- 2014/3/31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක දේපල පිරියත සහ උපකරණ සම්බන්ධව පහත තොරතුරු දී ඇත

| | |
|---|---|
| දේපල පිරියත සහ උපකරණ මත ක්ෂය | රු 500000 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණන මත හිගය | රු 150000 |
| මෝටර් රථ විකිණීමෙන් ලද ලාභය | රු 50000 |

2013/3/31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන යෙන් ජනනය වූ අතිරික්තය රු100000ක් විය · මෙම ගනුදෙනු හා සිද්ධි නිසා 2014/3/31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ ලාභය සහ මුළු විස්තීරණ ආදායමෙහි ශුද්ධ අඩුවීම කොපමණද

| | ලාභ යෙහි ශුද්ධ අඩුවීම රු | මුළු විස්තීරණ ආදායමේ ශුද්ධ අඩුවීම රු |
|---|---|---|
| 1 | 450 000 | 150 000 |
| 2 | 500 000 | 100 000 |
| 3 | 500 000 | 600 000 |
| 4 | 600 000 | 500 000 |
| 5 | 600 000 | 600 000 |

**2014 අගෝස්තු**

- 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමල් පොදු සමාගමට අදාළ පහත තොරතුරු ප්‍රශ්න අංක (19) සහ 20 ට පිළිතුරු සැපයීමට භාවිතා කරන්න·

| විස්තරය | '000 |
|---|---|
| විකුණුම් අයභාරය | 1000 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | 200 |
| සැපයුම්කරුවන්ගෙන් ලද වෙළඳ වට්ටම් | 100 |
| ගොඩනැගිල්ලක් විකිණීම මත ලාභය | 300 |
| මුළු වියදම | 500 |

2014 3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රත්‍යාගනනය මත රුපියල් 150 000 ක හිගයක් ඇති වූ අතර සමාගම එය වියදමක් ලෙස හඳුනාගෙන ඇත ·

(19) 2015 03:31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හඳුනාගත් මුළු ආදායම සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණද

| | මුළු ආදායම් | වෙනත් විස්තීරණ ආදායම් |
|---|---|---|
| 1 | 1450 | 50 |
| **2** | 1500 | 50 |
| 3 | 1500 | 200 |
| 4 | 1600 | 50 |
| 5 | 1600 | 200 |

(----)

(20) 2015 2015 3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මුළු විස්තීරණ ආදායම් සහ රඳවාගත් ඉපයුම් කොපමණද

| | මුළු විස්තීරණ ආදායම | රඳවාගත් ඉපයුම් |
|---|---|---|
| 1 | 950 | 950 |
| 2 | 1000 | 800 |
| **3** | 1000 | 950 |
| 4 | 1100 | 900 |
| 5 | 1100 | 1050 |

(---)**2015 අගෝස්තු**

- 2016/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත නාමල් පොදු සමාගමට අදාළ වේ ·

| විස්තරය | රු '000 |
|---|---|
| විකුණුම් | 1200 |
| විකුණුම් පිරිවැය | 600 |
| මෙහෙයුම් වියදම් | 300 |
| මෝටර් රථ විකිණීම මත ලාභය | 80 |
| සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 100 |
| ප්‍රත්‍යාගණන හිගය - කාර්යාල උපකරණ | 120 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය- ගොඩනැගිලි | 180 |

2015/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය මත රු 90000 ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි ·2016/03/31 දිනයෙන් අවසන් වර්ෂය තුළ දී ප්‍රථම වතාවට ගොඩනැගිලි පත්‍යාගණනය කර ඇත ·

**18** ශ්‍රී ලංකා ගිණුම් ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව 2016/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද මුළු ආදායම සහ මුළු වියදම කොපමණද?

| | මුළු ආදායම රු000 | මුළු වියදම රු 000 | |
|---|---|---|---|
| 1 | 1280 | 900 | |
| 2 | 1340 | 900 | |
| 3 | 1380 | 1020 | |
| 4 | 1460 | 1020 | |
| 5 | 1460 | 1120 | (----) |

**19** L K A S 1 ප්‍රමිතියට අනුව 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණද?

| | ලාභය රු000 | වෙනස් විස්තීරණ ආදායම් රු 000 | |
|---|---|---|---|
| 1 | 160 | 180 | |
| 2 | 250 | 90 | |
| 3 | 260 | 180 | |
| 4 | 350 | 90 | |
| 5 | 380 | 60 | (----) |

**20** ප්‍රමිතයට අනුව 2016/3/31 න් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම රඳවාගත් ඉපැයුම් කොපමණද?

| | මුළු විස්තීරණ ආදායම රු 000 | රඳවාගත් ඉපැයුම්රු 000 | |
|---|---|---|---|
| 1 | 340 | 160 | |
| 2 | 340 | 250 | |
| 3 | 440 | 250 | |
| 4 | 440 | 260 | |
| 5 | 440 | 280 | (----) |

**2016 අගෝස්තු**

- පහත දී ඇති තොරතුරු සීමිත ලංකා පොදු සමාගම හා බැදේ

| විස්තරය | 2017/3/31 රු000 | 2016/3/31 රු 000 |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | 5000 | 4600 |
| රඳවාගත් ඉපයුම් | 1500 | 900 |
| ප්‍රත්‍යාගණන සංචිත | 1000 | - |
| **එකතුව** | **7500** | **5500** |

**(21)** 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ දී රු 200 000 ක අතුරු ලාභාංශයක් ගෙවන ලද අතර 2017/4/15 වන රු 300000ක අවසන් ලාභාංශයන් ප්‍රකාශයට පත් කරන ලදි·2017/3/31ත'වන දින දේපල පිරියත හා උපකරණ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනහ කරන ලදී · 2017/3/31දිනයෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ මුළු විස්තීරණ ආදායම කොපමණද?

| | ලාභය රු 000 | මුළු විස්තීරණ ආදායම රු 000 | |
|---|---|---|---|
| 1 | 600 | 1000 | |
| 2 | 600 | 1600 | |
| 3 | 800 | 1000 | |
| 4 | 800 | 1800 | |
| 5 | 1100 | 2100 | (----) |

**2017 අගෝස්තු**

- එහත තොරතුරු සීමිත අජිත් පොදු සමාගමේ 2018/3/31 දිනෙන් අවසන් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී ·

| විස්තරය | රු |
|---|---|
| පිරිවැටුම | 800 000 |

| | |
|---|---|
| විකුණුම් පිරිවැය | 300 000 |
| පරිපාලන හා බෙදාහැරීමේ වියදම් | 80 000 |
| ප්‍රත්‍යාගණනය මත අතිරික්තය/ හිගය | |
| ඉඩම් | 60 000 |
| යන්ත්‍ර | 100 000 |
| කාර්යාල උපකරණ | (75 000) |

සියලුම දේපළ පිරියත සහ උපකරණ 2018 03:31 දින ප්‍රත්‍යාගණනය කරන ලදි· ඉඩම් **ප්‍රථම** වරට ප්‍රත්‍යාගණනය කළ අතර යන්ත්‍ර සහ කාර්යාල උපකරණ **දෙවන** වතාවට ප්‍රත්‍යාගණනය කරන ලදී · යන්ත්‍ර සහ කාර්යාල උපකරණ 2016· 03:31 දින **ප්‍රථම** වතාවට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පිළිවෙලින් රු 30 000 හිගයක් සහ රු 40,000 ක අතිරික්තයක් ඇති විය· සමාගමේ සියලුම වත්කම් හිමිකම් මගින් මූල්‍යනය කර ඇති අතර සමාගම ආදායම් බදු සඳහා යටත් නොවේ ·

2018·03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ මුළු ආදායම් සහ මුළු විස්තීරණ ආදායම්

**18**

| | මුළු ආදායම් රු | මුළු විස්තීරණ ආදායම් රු |
|---|---|---|
| 1 | 900 000 | 160 000 |
| 2 | 930 000 | 505 000 |
| 3 | 960 000 | 505 000 |
| 4 | 960 000 | 580 000 |
| 5 | 1000 000 | 160 000 |

(------)

**19** 2018 03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ ලාභලාභය වෙනත් විස්තීරණ ආදායම්

| | ලාභය | වෙනත් විස්තීරණ ආදායම් |
|---|---|---|
| 1 | 345 000 | 90 000 |
| 2 | 345 000 | 130 000 |
| 3 | 385 000 | 160 000 |
| 4 | 415 000 | 90 000 |
| 5 | 415 000 | 130 000 |

(------)

**2018 අගෝස්තු**

- 2019/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත සාරංග පොදු සමාගමට අදාළ වේ·

| විස්තරය | රු000 |
|---|---|
| පිරිවැටුම් | 950 |
| දළ ලාභය | 450 |
| පරිපාලන සහ බෙදා බෙදාහැරීමේ වියදම් | 250 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 150 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය | 75 |

වර්ෂය තුළදී ඉඩම් ප්‍රථම වතාවට ද මෝටර් රථ දෙවන වරටද ප්‍රත්‍යාගණනය කරන ලදී · 2017/03/31 දින ප්‍රථම වරට මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම තුළින් රුපියල් 35,000 හිගයක් ඇති විය· සමාගම සම්පූර්ණයෙන්ම හිමිකම් මගින් මූල්‍ය කර ඇති අතර ආදායම් බදු වලින් නිදහස්ය·

**23**

2019/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් හඳුනාගත් මුළු ආදායම් සහ මුළු වියදම

| | මුළු ආදායම් | මුළු වියදම |
|---|---|---|
| 1 | 1140 | 700 |
| 2 | 1140 | 750 |
| 3 | 1175 | 700 |
| 4 | 1175 | 750 |
| 5 | 1175 | 785 |

**24** 2019 03:31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම්

| | වර්ෂය සඳහා ලාභය රු 000 | වෙනත් විස්තීරණ ආදායම් රු000 |
|---|---|---|
| 1 | 165 | 225 |
| 2 | 200 | 225 |
| 3 | 200 | 190 |
| 4 | 235 | 190 |
| 5 | 235 | 225 |

(----)

**2019 අගෝස්තු**